## I කොටස

1) කාටීසීය තලය මත එකිනෙකට ලම්බකව ඡේදනය වන සංඛ්‍යා රේඛා දෙකක් පවතී. තිරස්ව පිහිටන රේඛාව නම් කරන්න.

2) තිරස් හා සිරස් අක්ෂ හමුවන ලක්ෂ්‍යය මූල ලක්ෂ්‍යය ලෙස නම් කරයි. මූල ලක්ෂ්‍යය ඛණ්ඩාංක ලියන්න.

3) (3, 5) ලක්ෂ්‍යයේ x ඛණ්ඩාංකය කුමක්ද?

4) ඛණ්ඩාංකයක් (x, 0) ලෙස දී ඇත. මෙම ලක්ෂ්‍යය පිහිටන්නේ කිනම් අක්ෂය මත ද?

5) A (5, 6) ලක්ෂ්‍යය වඩා ආසන්න x අක්ෂ්‍යයට ද? y අක්ෂ්‍යයට ද?

## II කොටස

1) A (5,0), B(0,4), C(0,2), D(0,3), E(0,0), F(5,4) යන ඛණ්ඩාංක සැලකූ විට,

   i) x - අක්ෂය මත පිහිටන ඛණ්ඩාංක සියල්ල ලියන්න.

   ii) y - අක්ෂය මත පිහිටන ඛණ්ඩාංක සියල්ල ලියන්න.

   iii) x හා y අක්ෂ $^{+}5$ තෙක් ක්‍රමාංකනය කළ කාටීසීය තලය අඳින්න.

   iv) ඉහත ලක්ෂ එහි ලකුණු කරන්න.

   v) A (0,0), E(5,0), G(0,5), H(5,5) ලක්ෂ්‍ය යා කළ විට සෑදෙන රූපයේ නම ලියන්න.

